සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

වාරය - දෙවන වාරය

| ශ්‍රේණිය :10 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 9 වන පාඩම<br>කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය<br>2 කොටස- උක්ත අනුක්ත භේදය |
|---|---|---|

නාම පදවල උක්ත අනුක්ත භේදය

- වාක්‍යයක ආඛ්‍යාතයෙන් කර්තෘ උක්ත වේ නම් එය කර්තෘ කාරක වාක්‍යයකි.
  උදා: පියා දරුවන් රකියි.

  මෙම වාක්‍යයේ “ පියා ” යන ආඛ්‍යාතයෙන් එම ක්‍රියාව කරන “ පියා ” උක්ත වී ඇත.

- වාක්‍යයක ආඛ්‍යාතයෙන් කර්තෘ අනුක්ත වී කර්මය උක්ත වේ නම් එය වාක්‍ය කර්මකාරක වාක්‍යයකි.
  උදා: පියා විසින් දරුවෝ රකිනු ලැබේ.

  මෙම වාක්‍යයෙහි “ රකිනු ලැබේ”. යන ආඛ්‍යාතයෙන් උක්ත වී ඇත්තේ “ දරුවෝ ” යන කර්ම පදයයි. රැකීමේ ක්‍රියාව කළ පියා අනුක්ත වී “ විසින්” යන නිපාත පදය ඊට එක්වී ඇත.

- ව්‍යාකරණානුකූලව නිවැරදිව ලිවීම සඳහා උක්ත අනුක්ත පද නිවැරදිව හඳුනාගත යුතුය.

| උක්ත | අනුක්ත |
|---|---|
| ඇත්තු | ඇතුන් |
| කොක්කු | කොකුන් |
| යක්කු | යකුන් |
| ගැමියෝ | ගැමියන් |
| වෙළෙන්දෝ | වෙළෙන්දන් |
| පියවරු | පියවරුන් |
| සිංහයෝ | සිංහයන් |

බහුවචන නාම පදවල උක්ත පදයෙහි අගට “ඕ” “උ” ප්‍රත්‍යයත්, අනුක්ත පදයෙහි “ උන්, අන්” ප්‍රත්‍යයත්, යෙදෙන බව මෙම වගුවෙහි ඇති පදවලින් පැහැදිලි වෙයි.

- ඒකවචන නාමවල උක්ත අනුක්ත භේදයට නිදර්ශන පද කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| උක්ත | අනුක්ත |
|---|---|
| ළමයා | ළමයා |
| ගොවියා | ගොවියා |
| කපුටා | කපුටා |
| බල්ලා | බල්ලා |
| ඇතා | ඇතා |
| ගස | ගස |
| මල | මල |

වගුවෙහි සඳහන් ඒකවචන පදවල උක්ත අනුක්ත වශයෙන් වෙනසක් නැති බව පෙනී යයි.

- සර්ව නාම පදවල (පුරුෂත්‍රය අනුව ) ඒකවචන -බහුවචන- උක්ත අනුක්ත භේදයට නිදසුන් පහත වගුවෙහි දැක්වේ

| රූපය | උක්ත පද | අනුක්ත පද |
|---|---|---|
| උත්තම පුරුෂ | මම<br>අපි | මා<br>අප |
| මධ්‍යම පුරුෂ | තෝ<br>ඔබ<br>නුඹ /නුඹලා | තා<br>ඔබ<br>නුඹ / නුඹලා |
| ප්‍රථම පුරුෂ | ඔහු<br>ඔවුහු<br>හේ/හෙතෙම<br>ඕ/ඈ/ඇය | ඔහු<br>ඔවුන්<br>ඔහු<br>ඇය |

- අනියමාර්ථ පදවල උක්ත අනුක්ත භේදයට නිදර්ශන පද පහත වගුවෙහි දැක්වේ.

| උක්ත | අනුක්ත |
|---|---|
| ඇතෙක් | අතෙකු |
| යකෙක් | යකෙකු |
| පියෙක් | පියෙකු |
| ළමයෙක් | ළමයෙකු |
| බල්ලෙක් | බල්ලෙකු |
| ගැහැනියෙක් | ගැහැනියක |
| කාන්තාවක් | කාන්තාවක |
| දැරියක් | දැරියක |

වගුවෙහි සඳහන් උක්ත අනුක්ත පද පිරික්සීමේදී පැහැදිලි වන්නේ අනියමාර්ථ පුරුෂ ලිංග පදවල දී උක්තයට "එක් " ප්‍රත්‍යයත්අනුක්ත පදයට " අකු " ප්‍රත්‍යයත් (අනුක්ත පදය " කු "අක්ෂරයෙන් අවසන් වන බවත්), ස්ත්‍රී ලිංග පදවල දී උක්තයට " අක් " ප්‍රත්‍යයත් අනුක්තයේදී " අක" ප්‍රත්‍යයත් (අනුක්ත පදය " ක" අක්ෂරයෙන් අවසන් වන බව ත්)

අචේතන හා සචේතන රූප ගැන්වූ නාම පද උක්ත අනුක්ත භේදයට නිදර්ශන පහත වගුවෙහි දැක්වේ.

| අචේතන නාම පද<br>උක්ත - අනුක්ත | අචේතන අනියමාර්ථ නාමපද<br>උක්ත - අනුක්ත | සචේතන රූප ගැන්වූ නාමපද<br>උක්ත - අනුක්ත |
|---|---|---|
| ගංගාව - ගංගාව | ගංගාවක් - ගංගාවක් | ගංගාවෝ - ගංගාවන් |
| ගංගා - ගංගා | රීතියක් - රීතියක් | රීතිහු - රීතීන් |
| රීතිය - රීතිය | පුෂ්පයක් - පුෂ්පයක් | පුෂ්පයෝ - පුෂ්පයන් |
| රීති - රීති | | වාක්‍යයෝ - වාක්‍යයන් |

ඉහත සියලු සටහන් මගින් පැහැදිලි වන කරුණු පහත පරිදි සාරාංශ කර ඔබගේ මතකයේ තබා ගැනීමේ පහසුව සඳහා මෙලෙස සඳහන් කරමි.

ඒකවචන ස්ත්‍රී ලිංග පද - ක

ඒකවචන පුරුෂලිංග පද - කු

ස්ත්‍රී ලිංග / පුරුෂලිංග බහුවචන පද - න්

උක්ත අනුක්ත පද මතක තබා ගැනීමට පහසුම ක්‍රමයක් ලෙස ඉහත වගුවෙහි

“ ක කු න් ”යන වචනය මතක තබා ගන්න

ස්වයං ඉගෙනුම් අභ්‍යාස

අභ්‍යාස 01.

- සුදුසු අනියමාර්ථ උක්ත හෝ අනුක්ත හෝ පද හිස්තැන් වලට යොදන්න.

1. ...................... තම ශිෂ්‍යයන්ට ගීයක් උගන්වයි.
2. .................. ඉක්මනින් ආහාර පිළියෙල කළා ය.
3. සෙබළු නගරයට ඇතුළු වූ ......................... අල්වා ගත් හ.
4. හෙතෙම.................... නැටුමට හැඩ ගැස්වීය.
5. අපි .................... පැටවා පිරිසිදු කරන සැටි දුටුවෙමු.

අභ්‍යාස අංක 02.

- පහත වාක්‍යවල උක්ත පදය නිවැරදි කර නැවත ලියන්න.

01. මිනිසුන් වැඩ කරති.
02. පාසලේ ගුරුවරුන් නැත.
03. මා ශිෂ්‍යයෙකු වෙමි.
04. ගොවියෙකු කුඹුර සී සායි.
05. සිංහයන් වනයේ සැරි සරති.
06. කපුටන් කුණු කසළ අවුස්සති.
07. සුදනන් යහගුණ පුරති.
08. තා පාඩම් කරහි.
09. පඬුවන් විසින් ඇතමෙකු යහමඟ යවනු ලබති.
10. ගුරුවරුන් විසින් ශිෂ්‍යයන් හික්මවනු ලැබෙති.

අභ්‍යාස අංක 03.

- පහත සඳහන් වාක්‍යවල අනුක්ත පදය නිවැරදි කර නැවත ලියන්න

01. නරක මිනිස්සු සත්තු මරති.
02. පියාණෝ අපි රකිති.
03. වැද්දෝ ගිරව් අල්ලති.
04. විදුහල්පති අපි ඇමතුහ.
05. අම්මා විසින් දරුවන් රකිනු ලබති.
06. රජුන් විසින් දරුවන් රකිනු ලබති.
07. පොලිසිය විසින් ඇතමෙකු අත් අඩංගුවට ගත්හ.
08. අධ්‍යක්ෂතුමා නිළියක් කැඳවිය
09. විශාරදයෝ විවිධ රීතිහු ඉදිරිපත් කළහ.
10. අධ්‍යක්ෂවරයා විසින් නිළියක කැඳවනු ලැබී ය.

සැකසුම : එච්.එම්.සී.ඩී. හේරත් මිය - මිනු /ශ්‍රී /ඥානාවාස ම.වි.-දිවුලපිටිය